# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2019
2023 දෙසැම්බර්

### සමාජීය විද්‍යා පීඨය

### ජනසන්නිවේදනය (නව/පැරණි නිර්දේශය)

### මාධ්‍ය ආචාර ධර්ම, මහජන සම්බන්ධතාව හා දැන්වීම් කලාව

## MACO – E 3015

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. 'මහජන සම්බන්ධතා යනු, යම් පාර්ශවයක් වෙනුවෙන් ඉලක්ක මහජන පිරිසක් පෙළඹවීම සඳහා සන්නිවේදන ක්‍රියාවලිය කළමනාකරණය කිරීමයි.' නිර්වචන හතරක් ඇසුරෙන් පහදන්න.

02. මහජන සම්බන්ධතා නිලධාරියාගේ භූමිකා මොනවාදැයි හඳුන්වා, ඔහු හෝ ඇය විසින් සිදු කරන කාර්ය උදාහරණ භාවිත කරමින් විශ්ලේෂණය කරන්න.

03. දැන්වීම්කරණය යනු කුමක්දැයි හඳුන්වා, නවමාධ්‍ය වේදිකාවන් තුළ භාවිත දැන්වීම්කරණ ක්‍රමවේද පිළිබඳ අධ්‍යයනයක් කරන්න.

04. දැන්වීම් නිර්මාණය කිරීමේදී භාවිත දැන්වීම්කරණ ප්‍රවේශ/ එළඹුම් පිළිබඳ නිදර්ශන සහිත විමසීමක් කරන්න.

05. 'ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් භාෂණයේ හා ප්‍රකාශනයේ අයිතිය මනා ලෙස විග්‍රහ කර තිබේ.' තෝරාගත් නඩු තීන්දු හතරක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

06. ජනමාධ්‍ය නිදහස පිළිබඳ කෙටියෙන් පැහැදිලි කර, ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය නිදහසට බාධාකාරී වූ සිදුවීම් තුනක් සාකච්ඡා කරන්න.

07. ශ්‍රී ලංකාවේ විද්‍යුත් මාධ්‍ය නියාමනයේ ගැටළු පැහැදිලි කර, විද්‍යුත් මාධ්‍ය ආචාරධර්ම ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ උදාහරණ ඇසුරෙන් විග්‍රහ කරන්න.

08. **පහත මාතෘකා දෙකක් (02) පිළිබඳ සටහන් ලියන්න.**

a) මහජන සම්බන්ධතා ප්‍රභේද
b) දැන්වීම්කරණයේ ඓතිහාසික ගමන්මග
c) මුද්‍රිත මාධ්‍ය දැන්වීම්කරණය
d) ශ්‍රව්‍ය දෘශ්‍ය දැන්වීම්කරණය
e) දැන්වීම්කරණ ආයතනයක ක්‍රියාවලිය
f) බුද්ධිමය දේපල පණත
g) අන්තර්ජාල නීති
h) ලේක්හවුස් පණත (සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති සමාගම)